# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 11 දරන අනිවාර්ය රජයේ සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 පෙබරවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 පෙබරවාරි මස 16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 30 යි. නැපැල් ගාස්තුව : ශත 25 යි.

## 1979 අංක 11 දරන අනිවාර්ය රජයේ සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 පෙබරවාරි මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 76/78.

### 1961 අංක 70 දරන අනිවාර්ය රජයේ සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 11 දරන අනිවාර්ය රජයේ සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මින් මතු මේ පනතෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 70 දරන අනිවාර්ය රජයේ සේවා පනතේ 2 වන වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද වෙනුවට, පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1961 අංක 70 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ලංකා විශ්ව විද්‍යාලයේ හෝ ආණ්ඩුව විසින් ප්‍රදානයක් කරනු ලබන්නා වූ ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද වෙන යම් විශ්ව විද්‍යාලයක හෝ උපාධිධරයකු බවට පත් වන්නාවූ ද ලංකා විශ්ව විද්‍යාලයේ හෝ ඒ වෙනත් විශ්ව විද්‍යාලයේ වෛද්‍ය උපාධිධරයකු නොවන්නා වූ; නැතහොත්

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බවට පත්වන්නා වූ ද ඒ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය උපාධිධරයකු නොවන්නා වූ ද ඉනික්බිතිව ලංකා විශ්ව විද්‍යාලය විසින් හෝ ලංකා විශ්ව විද්‍යාලයේ දී නැතහොත් ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද වෙනත් යම් විශ්ව විද්‍යාලයක් විසින් හෝ වෙනත් යම් විශ්ව විද්‍යාලයක දී සලසන ලද කාර්මික අභ්‍යාස පාඨමාලාවක් හදාරන්නා වූ; නැතහොත්

(ඇ) ලංකා විශ්ව විද්‍යාලයේ හෝ ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද වෙනත් යම් විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය උපාධිධරයකු වශයෙන් සිටීමෙන් ඉක්බිතිව, වෛද්‍ය ආඥාපනතේ අර්ථානුකූලව වෛද්‍ය වෘත්තිකයකු බවට පත්වන්නා වූ හෝ ඒ ආඥාපනතේ 32(1) වන වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල නියමයන් සපුරාලන්නා වූ".

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 2 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 2අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"වෛද්‍ය ආඥාපනතේ 32 වන වගන්තිය යටතේ සහතිකයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පළපුරුද්ද සෑම වෛද්‍ය උපාධිධරයකු විසින් ම අත් කරගත යුතු බව.

2අ. (1) වෛද්‍ය ආඥාපනතේ 32 වන වගන්තිය යටතේ ලංකා වෛද්‍ය සභාවෙන් සහතිකයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පළපුරුද්ද අත්කර ගැනීම ලංකා විශ්ව විද්‍යාලයේ හෝ වෙනත් යම් විශ්ව විද්‍යාලයක සෑම වෛද්‍ය උපාධිධරයකු ගේ ම කාර්යය විය යුතු අතර ඒ කාර්යය සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා නියම කරනු ලබන යම් නියම හා කොන්දේසි මත, අධ්‍යක්ෂවරයා විසින් වෛද්‍ය උපාධිධරයා වෙත නියම කරනු ලබන ආරෝග්‍යශාලාවක ඒ ආඥාපනත යටතේ

ඒ 39504—11,850 (79/01)

නියමිත කාලසීමාවක් සඳහා නේවාසික වෛද්‍ය තත්ත්වයකින් සේවා නියුක්තියෙහි යෙදීම කරනු ලැබිය යුතු ය.

(2) වෛද්‍ය ආඥාපනතේ 32 වන වගන්තිය යටතේ සහතිකය ලබා ගැනීමෙහි ලා අවශ්‍ය පළපුරුද්ද අත්කර ගැනීමේ කාර්යය සඳහා නේවාසික වෛද්‍ය තත්ත්වයකින් සේවානියුක්තියෙහි යෙදෙන (මින් මතු මේ පනතෙහි "සීමාවාසික වෛද්‍ය නිලධරයා" යනුවෙන් එම උපාධිධරයා හඳුන්වනු ලබන) වෛද්‍ය උපාධිධරයකු ඒ සේවා නියුක්ති කාලසීමාව තුළ දී ඒ සේවානියුක්තියෙන් අස් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2ආ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි (මේ පනතින් ඇතුළත් කරන ලද) 2අ වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 2ආ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"2අ වන වගන්තිය යටතේ වූ බැඳීම් ඉටු කිරීම පැහැර හැරීම වරදක් බව.

2ආ. 2අ වන වගන්තියෙන් වෛද්‍ය උපාධිධරයකු වෙත පැවරී ඇති බැඳීම් ඉටු කිරීමේ දී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබූ විට සීමාවාසික වෛද්‍ය නිලධරයකු වශයෙන් සේවා නියුක්තියෙහි යෙදීම ප්‍රතික්ෂේප කරන හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සීමාවාසික වෛද්‍ය නිලධරයකු වශයෙන් සේවා නියුක්තියෙහි යොදවනු ලැබ සිටිය දී එසේ යොදවනු ලැබූ කාලසීමාව සඳහා එම තත්ත්වයෙන් සේවය කිරීම පැහැර හරින සෑම වෛද්‍ය උපාධිධරයකු ම නිසි පරිදි පවත්වනු ලැබූ වෛද්‍ය පරීක්ෂණයකින් පසුව ඒ සේවා නියුක්තියෙහි යෙදීමට හෝ එම තත්ත්වයෙන් සේවය කිරීමට හෝ වෛද්‍ය මතානුකූලව නුසුදුසු යයි ප්‍රකාශ කරනු ලැබුවහොත් මිස, වරදකට වරදකරු විය යුතු අතර, ඒ ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම කෙරෙන කාලය තුළ වූ සෑම දවසක් සඳහා ම රුපියල් එකසිය පනහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1අ) රජයේ සේවයේ උචිත ධූරයකට කරනු ලබන අනිවාර්ය රජයේ සේවයට යටත් උපාධිධරයකුගේ සෑම පත්වීමක් ම, ඒ පත්වීම කරනු ලබන බලධරයා විසින් නියමිත කාලයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර ඔහුගේ පත්වීමේ දිනය වශයෙන් එහි සඳහන් දිනයේ සිට ඔහුගේ පත්වීම බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) මේ පනතේ කාර්ය සඳහා—

(අ) රජයේ සේවයේ යම් උචිත ධුරයකට යම් තැනැත්තකුගේ පත්වීම ඒ පත්වීම කරනු ලබන ලිපියේ හෝ වෙනත් සාධන පත්‍රයේ, නැතහොත් ඒ පත්වීම පළ කරන ලද ගැසට් පත්‍රයේ හෝ සඳහන් දිනයක හෝ ඒ පත්වීම කරන ලද තැනැත්තා හෝ බලධරයා විසින් කල් තබනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ සිට ක්‍රියාත්මක වීමට නියමිත ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) රජයේ සේවයේ යම් උචිත ධුරයකට යම් තැනැත්තකු පත්වීම, ඒ පත්වීම කරන ලද ලිපියේ හෝ වෙනත් සාධන පත්‍රයේ නැතහොත් පත්වීම පළ කරන ලද ගැසට් පත්‍රයේ දිනයක් සඳහන් වේ නම්, (ඔහු අනිවාර්ය රජයේ සේවයට යටත් වූ දින සිට පස් අවුරුදු කාලසීමාවක් පසු වී ඉකුත් නොවන දිනයක් වන) එම දිනයෙහි හෝ එසේ දිනයක් සඳහන් නොවේ නම්, ඒ පස් අවුරුදු කාලසීමාව අවසානයෙහි ඉකුත් වීමට නියමිත දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.".

7. මේ පනතේ 2 වන, 3 වන, 5 වන සහ 6 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1979 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. සංශෝධන අතීතයට බල පෑ යුතු බව.